# 2024 අංක 09 දරණ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සම්බන්ධ ප්‍රකාශනය

**2024 පෙබරවාරි 7 වන දින**
මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත බලාත්මක කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය මඟින් ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය සහ ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි මතු කෙරෙන බරපතල ගැටළුකාරී බලපෑම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අවධානය යොමු කරයි. මීට පෙර ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙකී ගැටළු ඉස්මතු කර ඇති නමුත් මෙම ගැටළුකාරී ක්‍රියා පටිපාටීන් අඛණ්ඩව සිදු වෙමින් පැවතීම බලාපොරොත්තු සුන් කරවන්නකි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය රහසිගතභාවය තුළ වැසී යනු ලැබුනකි. කඩිමුඩියේ එය සම්මත කිරීමට පියවර ගනු ලැබූ ආකාරය ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන නීතියක් පැනවීම සම්බන්ධව රජයේ සැබෑ ම අරමුණ කුමක්ද යන්න පිළිබඳ ගැටළු ඉස්මතු කරයි. පනත් කෙටුම්පතේ හරයාත්මක කරුණු සහ එය සම්මත කිරීමේ දී අනුගමනය කරන ලද කාර්යපටිපාටිය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර අදහස් දක්වා ඇති අතර එම පනත් කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරන ලදී. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත බලාත්මක කිරීම හා සම්බන්ධ මෑත කාලීන සිදුවීම් දාමය දෙස බලන කල භාෂණයේ නිදහස සහ විරුද්ධ වීමේ අයිතිය තවදුරටත් හැකිළීමට හේතුවන එවැනි කුරිරු නීතියක් පැනවීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දැඩි ලෙස හෙළා දකී.

2024 ජනවාරි 24 වන දින කාරක සභා අවස්ථාවේ පනතට සිදු කරන ලද සංශෝධන සම්බන්ධ ගැටළු කෙරෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අවධානය යොමු කර සිටී. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කිරීම පිණිස එයට සංශෝධන 31ක් සිදු කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය සිය තීන්දුව ලබා දුන් අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාවෙන් දක්වා ඇති “පාර්ලිමේන්තුවේදී පනත් කෙටුම්පතක් සඳහා යෝජිත ඕනෑම සංශෝධනයක් එම පනත් කෙටුම්පතේ කුසලතා සහ මූලධර්මවලින් බැහැර නොවිය යුතුය” යන අවශ්‍යතාවය සමඟින් අනුකූල වීම සම්බන්ධයෙන් ප්‍රශ්න මතු විය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම ක්‍රියාවලිය ආරම්භයේදීම සඳහන් කළේ යෝජිත කාරක සභා අවස්ථා සංශෝධන සැලකිය යුතු මට්ටමේ සංශෝධන වන බැවින්, පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගෙන නැවත ගැසට් කළ යුතු බවයි. එසේ තිබියදීත්, සරල බහුතරයකින් නීතිය සම්මත කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවශ්‍ය බවට දක්වා ඇති අනිවාර්ය සංශෝධන සම්මත කර ගැනීමට රජය අපොහොසත් වූ අතර, පනත් කෙටුම්පත සම්මත කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගියේය.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

නිදසුනක් වශයෙන්, විමර්ශනවලට සම්බන්ධ සියලුම පුද්ගලයන් විමර්ශනයට භාජනය වන්නන්ගෙන් ලබා ගන්නා තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යන බවට රජය සහතික විය යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද නමුත් වත්මන් පනතේ එවැනි ආරක්ෂාවක් නොපවතී (ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ 60වන පිටුව බලන්න). "ද්වේෂ සහගත" සහ "අනවශ්‍ය" වැනි පාරිභාෂිතයන් ඇතුළත් කිරීම නොපැහැදිලි බව අධිකරණය විසින් තීරණය කරන ලදී (ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ 48වන පිටුව බලන්න), නමුත් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 14 වැනි වගන්තියේ එවැනි වචන තවදුරටත් අන්තර්ගත කර තිබේ. එපමණක්ද නොව, එස් එම් එස් (කෙටි පණිවිඩ) / එම් එම් එස් (බහුමාධ්‍ය පණිවිඩ) සේවා මගින් සක්‍රීය කර ඇති එකම පරිශීලක-උත්පාදිත අන්තර්ගතය වන ඊමේල් (විද්‍යුත් තැපෑල)  වැනි ඇතැම් සේවාවන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතින් නිදහස් කළ යුතු බවටද දක්වා තිබිණි (ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ පිටු 59 සිට 60 දක්වා බලන්න). කෙසේ වෙතත්, රජය එකී වෙනස්කම් සිදු නොකර ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සංශෝධනය විය යුතු බවට අවධාරණය කර ඇති විධිවිධාන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත හි 27 වැනි වගන්තිය යටතේ තවදුරටත් පවතින අතර, එමගින් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය හිතාමතාම නොසලකා හැර ඇති බවට කනස්සල්ලක් මතුව තිබේ.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත නීතිගත කිරීමට ආණ්ඩුව කඩිමුඩියේ කටයුතු කිරීම සහ එහි දී ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය නොසලකා හැරීම ව්‍යවස්ථාමය අර්බුදයකට තුඩු දී ඇති අතර, පනතෙහි නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ද ප්‍රශ්න මතු කරයි. එපමණක් නොව, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය හිතාමතාම හෑල්ලුවට ලක් කරමින්, රජය විසින් ලබා දෙමින් පවතින භයානක පූර්වාදර්ශය ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය සහ බලතල බෙදීම කෙරෙහි අයහපත් අන්දමේ ඇඟවුම් මතු කරමින් සිටී.

මෙම කනසල්ල දක්වන තත්ත්වයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය  විසින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතෙහි සන්දර්භයට අදාළව මීට පෙර ඉස්මතු කරන ලද වෙනත් ගැටළු රාශියක්, එනම් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවේ පුළුල් බලතල, නොපැහැදිලි පාරිභාෂිත වචන, සහ ප්‍රවීණයන්ගේ භූමිකාව වැනි කරුණු හා සම්බන්ධ වේ.

මෙකී කරුණු සහ අනෙකුත් අවධාරණයන් සැලකිල්ලට ගනිමින්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතෙහි ක්‍රියාවලිය සහ හරය සමාලෝචනය කිරීමට සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අවලංගු කිරීමටත්, මාර්ගගත ආරක්ෂාව පිළිබඳ ගැටළු අව්‍යාජ ලෙස ආමන්ත්‍රණය කරන නීතියක් හඳුන්වාදීමටත් ඉක්මන් පියවර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය  රජයෙන් ඉල්ලා සිටී. තවද, පනතක් සම්බන්ධ මත විමසීම සහ එය නිසි පරිදි සමාලෝචනය කිරීම සඳහා පංගු පාර්ශ්වකරුවන්ට කාලය ලබා දෙන විනිවිදභාවයෙන් යුත් සහ අන්තර්කරණය කරගත් නීති සම්පාදන ක්‍රියාවලියක් ඇති කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය  රජයෙන් ඉල්ලා සිටී. 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත බලාත්මක කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රියාදාමයන්, නීති සම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයෙන් හා විවිධ දෘෂ්ටිකෝණයන්ට අනුව සිදු වූ බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ගනු ලැබූ අවස්ථාවන්ට උදාහරණ වේ. ශ්‍රී ලංකාව ප්‍රකෘතිමත් වීමේ සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට භාජනය වන තත්වයක් තුළ එවැනි යහපාලන භාවිතයන් මූලික වේ.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org